මෙම පරිච්ඡේදය මගින් මෙම නිබන්ධනය පිළිබඳ හැඳින්වීමක් මෙන්ම එහි ගැටලුව, උපන්‍යාසය, අරමුණු හා අභිමතාර්ථයන් පිළිබඳවත් පර්යේෂණ ක්‍රමවේදය මෙන්ම පර්යේෂණ සීමා පිළිබඳව ද කරුණු දක්වන අතර පර්යේෂණ වාර්තාව පිළිබඳ දළ සැලැස්ම ඉදිරිපත් කොට ඇත.

## 1:1. හැඳින්වීම

ස්වභාවධර්මය විසින් ගොඩනගන ලද අපූර්වතම දෑ ග්‍රහණය කර ගනිමින් යම් ආශ්චර්‍යනීය වූ දෙයක් නිර්මාණය කිරීම උදෙසා මිනිස් මොළය සතු සංජානන හැකියාව සැබැවින්ම විස්මිතය. නිර්මාණකරණයේදී අපූර්වත්වයෙන් යුත් දෑ නිර්මාණය කිරීමේ හැකියාව ඇත්තේ ප්‍රතිභාව ඇත්තවුන්ට පමණි. තෝරාගනු ලැබූ අනුමැතිය මත නිර්මාණකරුවා මෙහෙයවනු ලබන්නේ පරිකල්පනය හරහාය. ව්‍යුත්පත්තිය හා බහුශ්‍රැතතාව නිර්මාණකරුවාට නිසරු දෑ බැහැර කරමින් සරුදේ තෝරා ගැනීමට දායක වේ.

නිර්මාණකරුවා යම් නිර්මාණයක් මගින් නිර්මාණශීලිත්වය හරහා ප්‍රධාන ලෙස මනස සංජානනය කරනු ලබයි. නිර්මාණයක් මනස පිනවා අවසානයේ බුද්ධිය හා ශරීරය පිනවනු ලැබේ. මිනිසා තමා විවිධ ක්‍රම මගින් ලබාගන්නා දැනුම හා අත්දැකීම් හේතු කොටගෙන අවිඥානිකව හෝ සවිඥානිකව මේ හා බැඳේ. මෙම නිර්මාණයන් මිනිසා විසින් විවිධාකාරවූ ලෙස භාවිතා කරන්නට වුණි. සන්නිවේදන කාර්යයට, සතුට මෙන්ම ශෝකය ප්‍රකාශ කිරීමට, මානසික විශ්‍රාන්තිය උදෙසා, හැඟීම් ප්‍රකාශනයට මෙන්ම වින්දනය ආදී වූ දේ බොහෝ දෑ වී අතර විය.

මෙම නිර්මාණ කාර්යයන් සඳහා වන මාධ්‍ය අතර එන සිනමාව මෙකී බොහෝ කාර්යයන් එක් කොට ගත්තකි. මෙය නූතනයේ මිනිසාගේ ප්‍රධානතම වින්දන මාධ්‍යයන්ගෙන් එකක් බවට පත්ව ඇත. රූප භාෂාව වූකලී ප්‍රතිභාසම්පන්න මාධ්‍යයකි. යම් නිර්මාණකරණයකදී එම නිර්මාණකරුවාට ස්වකීය භාෂාව අමතක කළ හැක්කේ නම් ඔහු සැබවින්ම අතිසාර්ථක වනුයේ රූප භාෂාව විශ්ව භාෂාවක් වන හෙයිනි. උදාහරණයක් වශයෙන් ගතහොත් අන්ධ මිනිසෙකු අන්ධයකු බව ප්‍රකාශ කිරීමට එම වචනම අවැසි නොවේ. ඔහු යමක් අල්ලන ආකාරය පෙන්වීමෙන් රූප භාෂාව මගින් එය වචනයෙන් කරනවාට වඩා

හොඳින් හදවත ආමන්ත්‍රණය කිරීම සිදුකළ හැක. මේ හෙයින්ම සිනමාව සැබැවින්ම මනස දැඩිව ග්‍රහණය කරනු ලබන භාෂාවකින් යුත් අපූර්වතම වින්දන මාධ්‍යයක් වේ.

නූතනයේ 'සිනමාව' මිනිසාගේ ප්‍රධානතම වින්දන මාධ්‍යයන්ගෙන් එකක් බවට පත්ව ඇත. රූපය මෙසේ වින්දනීයත්වයකින් යුක්තව ප්‍රේක්ෂකයා කරා යන ගමනේදී එහි රිද්මය ගොනු කරනුයේ සමෝධානය හෙවත් සංස්කරණ ක්‍රියාවලිය මඟිනි. එහෙයින් රූප භාෂාව ගොඩනැංවීමෙහි ලා ප්‍රධාන තැනක් සංස්කරණයට හිමිවේ.

'සංස්කරණය' යන පදය භාවිතය පිළිබඳ ලාංකීක සිනමාව තුළ මතවාදයන් නැත්තේම නොවේ. මෙම පදය හුදෙක් පුවත්පත් කලාව මඟින් සිනමාවට දායක වුවක් බව ඇතැම්හු පවසති. යම් ලිපියක් රචනා කිරීමේදී එම ලේඛකයා ඒ හා සම්බන්ධ සියලු දත්ත කියවා පුවත්පත් සංස්කාරක සමග එක්ව උචිත දෑ පමණක් තෝරා ගනිමින් වඩා පැහැදිලි නිවැරදි ලේඛනයක් සකසාලයි. මෙම 'සංස්කාරකගේ' ක්‍රියාවලිය ඔස්සේ ගොඩනැගෙන 'සංස්කරණය' යන පදය සිනමා සංස්කරණය උදෙසා නුසුදුසු බව පවසන ඇතැම් සංස්කාරකයෝ රූප රචනය යන්න ඒ සඳහා වඩාත් යෝග්‍ය යැයි පෙන්වා දෙති.

එඩ්වින් එස් පෝටර් විසින් සොයගන්නට යෙදුනු මෙම අපූරූ මූලධර්මය සිනමාව ලොව ප්‍රබලතම මාධ්‍ය බවට පත්කරලීය. මෙම ක්‍රියාවලියේ කාර්යභාර්ය වඩාත් පැහැදිලි කරමින් වරෙක කුලෂොව් පවසනුයේ සිනමාවෙහි අර්ථය වෙනස් වන්නේ එම පිළිඹිබුවට පසුව යොදා ඇති පිළිඹිබුව හේතුවෙන් යනුවෙනි.

වරෙක සිනමාවට අභියෝගයක් වී නැගී සිටින රූපවාහිනි මාධ්‍ය අභිබවා යාමටද මෙම සංස්කරණ ක්‍රියාවලිය පිටිවහලක් වුයේ ශබ්ද සංස්කරණය හරහා නව පෙරළියක් ඇති කරලමිනි. වර්තමානය වන විට සංස්කරණය හෙවත් රූප රචනය සිනමාව උදෙසා නැතුවම බැරි සාධකයකි. සිනමා කෘතියක් තුළ කාලය හා අවකාශය හැසිරවීම උදෙසා සංස්කරණය විසින් ලබාදෙන දායකත්වය මෙයට ප්‍රධානතම සාධකය වේ.

කාර්මික විප්ලවය සමඟ ඇතිවන්නාවූ විද්‍යුත් තාක්‍ෂණයේ දියුණුව සාමාන්‍ය මිනිස් ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමට හේතු විය. මෙය මිනිසාගේ ජීවිතය පමණක් නොව ඒ හා බැඳුනු සෑම දේකටම පාහේ එකසේ බලපාන්නට වූයෙන් එහි ආස්වාදය නොඅඩුවම සිනමාවට ද බලපෑමේ ප්‍රතිඵලයක් ලෙසින් සංස්කරණ ක්‍රියාවලියද නව ජීවයක් ලබන්නට විය.

අධ්‍යතනය වනවිට සංස්කරණ ක්‍රියාදාමය හා පරිගණක තාක්‍ෂණය එකිනෙක අත්වැල් බැඳ සිටී. මෙම සැබැඳියාව සංස්කරණ ශිල්පියාටද එකසේ බලපා ඇත. රූප රිද්මය මනාව ගැලපීමෙහිලා නව ආරක් නව සංකල්පයක් සොයා යාමට සංස්කරණ ශිල්පියා පෙළඹවීමට මෙය හේතු පාදක වී ඇත. අතීතයේදී සිනමාකෘතියක දී දිනක් ගතවී තව දිනක් උදාවනු දැක්වූයේ හිරු බැසයාමේ හා නැවත නැඟ ඒමේ දර්ශනයක් පෙන්වමිනි. නමුදු වර්තමානයේ Cut, Wipe, Fade in, Fade out, Mix ආදී වූ සංස්කරණ ක්‍රමවේදයන් එදාට වඩා නවීනත්වයකින් යුක්තව යොදා ගනිමින් ඉදිරි පියවරක් තබා තිබෙනු දැකිය හැකිය. මේ උදෙසා මිනිසාගේ මනස තුළ සිදුව ඇති පරිකල්පනීය දියුණුවද දායකත්වයක් ලබාදී තිබේ.

මෙලෙසින් නව අරුත් සොයා යන ගමනේදී සංස්කාරකයන් විසින් විවිධ ක්‍රමවේදයන් ශිල්පීය ක්‍රමයන් ආදිය සොයා ගනු ලැබ ඇති අතර තවමත් නව මං සොයමින්ද පවතී. මේ ආකාරයෙන් සිනමා සංස්කරණ ක්‍රියාවලිය තුළ පරිගණකයේ ආගමනයත් සමඟ සංස්කරණ ශිල්පියාහට වන බලපෑම විවිධ විය. මෙම සැබැඳියාවේ ප්‍රතිඵලයන්හි අතිශය වින්දනාත්මක ආස්වාදය ලැබුවේ ප්‍රේක්‍ෂකයින්ය.

මෙම අධ්‍යයනය මඟින් පරිගණකයේ එක්වීම සමඟ සිනමා සංස්කරණයට එක්වන්නා වූ අලුත් දෑ සහ ඒවා සංස්කරණ ශිල්පියාට දායකත්වය ලබාදී තිබෙන ආකාරයත් ඒවා තුළ වඩාත් උචිත හා වඩාත් අකාර්ශනීය දෑ මෙන්ම අඩුපාඩු හා දුර්වල ස්ථානයන්ද හඳුනා ගැනීමට හැකි වේ. නව දෙයක් නිර්මාණය කිරීමට මෙන්ම වඩාත් කලාත්මක වින්දනීය නිර්මාණයක් උදෙසාද එකී දැනුම මහෝපකාරී වනු නිසැකය.